## සෙනසුරාදා

පළමුවන කියැවීම රෝම 11: 1-2, 11-12, 25-29

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

ඔවුන්ගේ පිරිහීම විජාතීන්ට සුබ සෙත පිණිස ද වේ.

එසේ නම් දෙවියන් වහන්සේ සිය සෙනඟ අත් හළ සේක් දැ යි මම ප්‍රශ්න කරමි. කොහෙත් ම නැත. මන්ද, මමත් ආබ්‍රහම්ගේ පෙළපතට ද බෙන්ජමින් ගේ ගෝත්‍රයට ද අයත් ඉශ්‍රායෙල් ජාතිකයෙක්මි. දෙවියන් වහන්සේ ආදියේ දී තෝරා සිය සෙනඟ අත් නොහළ සේක. ශුද්ධ ලියවිල්ලේ එලියා ගැන ලියා තිබෙන පරිදි ඔහු ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව දෙවියන් වහන්සේට චෝදනා කළ සැටි ඔබ දන්නවා නොවේ ද?

එසේ වී නම්, ඔවුන් පැකිළුණේ වැටෙන පිණිස දැ යි ප්‍රශ්න කරමි. එසේ නොවේ. ඉශ්‍රායෙල් ජාතියේ වැටීම හේතුකොටගෙන විජාතීන්ට ගැළවීම පැමිණ තිබේ. එසේ වූයේ ඉශ්‍රායෙල්වරුන් තුළ උනන්දුව පුබුදුවනු පිණිස ය. ඉදින් ඔවුන්ගේ වැටීම ලෝකයාට සුබ සෙත පිණිස ද වේ නම්, ඔවුන්ගේ සම්පූර්ණ නැගීම කොපමණ වැඩියෙන් සුබ සෙත පිණිස නොවන්නේ ද? සහෝදරයෙනි, ඔබ ඥානවන්තයෝ යයි සිතමින් අහංකාර නොවන පිණිස ඔබ විසින් දත යුතු අභිරහසක් ඇතැයි සිතමි. එනම්, ඉශ්‍රායෙල් ජනතාව තුළ තරමක සිත් දැඩිකම පවතින්නේ විජාතීන් සියලු දෙනා ම ගැළවීම ලබන තුරු පමණෙකි. ඉන්පසු මුළු ඉශ්‍රායෙල් ජනතාව ම ගැළවීම ලබන්නෝ ය. ඒ බවට: "සියොන්හි සිට ගැළවුම්කාරයාණෝ වඩින සේක, උන් වහන්සේ ජාකොබ්ගේ පෙළපතින් දුෂ්ටකම දුරු කරන සේක. ඔවුන්ගේ පාප දුරලන කල, ඔවුන් සමඟ මම මේ ගිවිසුම ගනිමි" යි ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇත. ජුදෙව්වරුන් සුබ අස්න ප්‍රතික්ෂේප කළ නිසා ඔවුහු දෙවියන් වහන්සේගේ සතුරෝ වූහ. එය ඔබගේ යහපතට හැරිණි. එහෙත් ඔවුන්ගේ පියවරුන් නිසා දෙවියන් වහන්සේ ඔවුන් තෝරා ගත් බැවින්, ඔවුහු දෙවියන් වහන්සේගේ මිත්‍රයෝ වූහ. දෙවියන් වහන්සේ සිය දීමනා ද කැඳවීම ද වෙනස් නොකරන සේක.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 94: 12-15, 17-18

පිළිතුර : සමිඳාණෝ අප අත් නොහරින සේක.

ගීය : සමිඳුනි, ඔබ උවදෙස් දුන් මිනිසා භාග්‍යවන්ත ය.
ඔබේ අණ පණත් ඉගැන්වූ තැනැත්තා භාග්‍යවන්ත ය.
ඔහුගේ විපත්ති දිනවලට පසු ඔහුට ඔබ නිදහස දෙන සේක.

සමිඳාණෝ සිය සෙනඟ ඉවත නොලන සේක.
තෝරාගත් සිය සෙනඟ අත් නොහරින සේක.
අධිකරණයෙන් සාධාරණ ලෙස නැවත තීන්දුව එන්නේ ය.
එවිට දැහැමි සිත් ඇති සියල්ලෝ එය අනුගමනය කරන්නෝ ය.

සමිඳාණෝ මට පිහිට නොවූ සේක් නම්
මළවුන්ගේ ලෝකයට විගස යැමට මට සිදුවන්නට තිබිණි.
"මාගේ පාද ලිස්සන්නේ ය" යි මා කී කල සමිඳුනි,
එවිට ඔබේ තිර පෙම මාගේ ආධාරය වූයේ ය.

සුපුවත් ජය නද කොලොස්සි 3: 16, 17

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේගේ දහම් පණිවුඩය ඔබ තුළ
සියලු ප්‍රඥාවෙන් සමෘද්ධ ව පවතීවා!
උන් වහන්සේ තුළින් දෙව් පියාණන්ට තුති කරන්න.
ආලේලූයා!

නොහොත්

සාධුකාරය මතෙව් 11: 29

ආලේලූයා! ආලේලූයා!
"මා ගුණවත්, මෘදු, නිහතමානි කෙනෙකු බැවින්
මාගේ වියගහ කරට ගෙන මාගෙන් ඉගෙන ගන්න" යයි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 14: 1, 7–11

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"තමාම පහත් කර ගන්නා උසස් කරනු ලැබේ."

සබත් දිනක ජේසුස් වහන්සේ නායක පරිසිවරයකුගේ ගෙදරට කෑම පිණිස වැඩිය සේක. හැම දෙනාම උන්වහන්සේ දෙස සෝදිසියෙන් බලා සිටිය හ. ආරාධනා ලත් අය ප්‍රධාන ආසන ලබා ගන්නට සොයන බව දැක, උන්වහන්සේ ඔවුන්ට මේ උපමාව කියමින්, "යමෙකුගේ විවාහ මඟුලකට කැඳවීමක් ඔබට ලැබුණොත් ප්‍රධාන ආසනයේ හිඳ නොගන්න. යම් හෙයකින් ඔබට වඩා උසස් කෙනෙකු කැඳවනු ලැබුවොත්, ඔබ දෙදෙනාම කැඳවූ තැනැත්තා අවුත්, 'මෙය ස්ථානය මොහුට දෙන්නැ' යි ඔබට කීවොත්, ලජ්ජාවෙන් යුක්ත ව පහත්ම ස්ථානයට යන්නට සිදු වේ. එහෙත් ඔබ කැඳවනු ලැබූ කල ගොස් පහත් ම ස්ථානයෙහි හිඳගන්න. එවිට ඔබ කැඳවූ තැනැත්තේ අවුත්, 'මිත්‍රය ඉහළ තැනකට එන්නැ' යි ඔබට කීවොත් ඔබ සමඟ කෑමට හිඳින සියල්ලන් ඉදිරියෙහි ඔබ ගෞරව ලබන්නෙහි ය. තමා ම උසස් කර ගන්නා හැම දෙනා ම පහත් කරනු ලබති. තමා ම පහත් කර ගන්නා, උසස් කරනු ලැබේය" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.